# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 67/14—1979 දෙසැම්බර් 21 වැනි සිකුරාදා—1979.12.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.— බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු, 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමාවලිය.

ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1979 දෙසැම්බර් මස 21 දින,
කොළඹ දී ය.

**නියමාවලිය**

1. මෙම නියමාවලිය 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යා ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර 1980 ජනවාරි මස 01 දින සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

2. ඉවත් කරන ලද 1972 අංක 1 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පනතේ 85 වන වගන්තිය සමඟ කියවිය යුතු 4 (ද) වගන්තිය යටතේ සාදනු ලැබූ පහත සඳහන් නියමයන් සහ ඉහත කී පනතේ 85 වන වගන්තිය සමඟ කියවිය යුතු 34 වන වගන්තිය යටතේ සාදන ලදුව, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලද්ද වූ නියමාවලියක් ලෙස එකී පනතේ 140 (2) වගන්තිය අනුව සලකනු ලබන්නා වූ පහත සඳහන් ලිඛිත ව්‍යවස්ථාව, එම නියමයන් සහ එම ලිඛිත ව්‍යවස්ථාව යටතේ මීට ඉහතදී කරන ලද කිසිදු ක්‍රියාවකට හානියක් නොවන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ :—

(අ) 1976 ඔක්තෝබර් මස 13 දිනැති අංක 234/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ;

(ආ) 1976 නොවැම්බර් මස 29 දිනැති අංක 241/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ;

(ඇ) 1977 මාර්තු මස 30 දිනැති අංක 258/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ; සහ

(ඈ) 1977 මාර්තු මස 30 දිනැති අංක 258/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1977 අංක 1 දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ආයුර්වේද වෛද්‍ය ආයතන ලිඛිත ව්‍යවස්ථාව.

3. මෙම නියමාවලිය ක්‍රියාත්මක වූ පසු (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් මෙම නියමාවලියෙහි විධිවිධාන යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.

4. (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට මෙම ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතු ය.

1A——ඒ 47094—3,300 (79/12)

5. පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානයන්ට හා කොමිෂන් සභාවේ බලතල, කාර්‍ය්‍ය හා කර්තව්‍යවලට යටත්ව, ආයතනයට පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේ ය :—

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන දේශීය වෛද්‍ය විද්‍යාවේ යම් අංශයන්හි ඒ අංශ පිළිබඳ ඉගැන්වීම සහ පුහුණුවීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) දේශීය වෛද්‍ය විද්‍යාවේ විවිධ වෛද්‍ය අංශවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමර්ථ්‍යය ලබා, විශ්වවිද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් පනවන ලද වෙනත් කොන්දේසි සපුරාලීමෙන් උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ඈ) විශ්වවිද්‍යාලයේ අනුමතයත්, කොමිෂන් සභාවේ එකඟත්වයත් ඇතිව, දේශීය වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම ;

(ඉ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලදී හෝ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවලදී සාමර්ථ්‍යය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාලසීමාව ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(උ) ආයතනයේ කාර්යයන් සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉගැන්වීමේ, පුහුණු කිරීමේ සහ පර්යේෂණ කටයුතු සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වා ගෙන යාම ;

(ඌ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි මහාචාර්යධුර, සහාය මහාචාර්යධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධුර, සහ වෙනත් තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම ;

(ඒ) ආයතනයේ ශිෂ්‍යයන්ගේ හා ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවකයන්ගේ වාසය, විනය සහ ශුභ සිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඔ) නේවාසිකාගාර පිහිටුවා පාලනය කිරීම, ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සලස්වන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ආයතනයේ ශිෂ්‍යයන්ගේ වාසය පිණිස අවශ්‍ය විය හැකි වෙනත් එවැනි සේවා හා පහසුකම් සැලැස්වීම ;

(ඕ) ණය ලබා දීම සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව ආයතනයේ ශිෂ්‍යයන්ට බැංකුවලින් හා වෙනත් ආයතනවලින් ණය ලබා ගැනීමට සහාය වීම ;

(ක) පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්වවිද්‍යාලයෙන් හා ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව පිළියෙල කිරීම ;

(ග) ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් රීතියක් අනුව ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම ; සහ

(ච) ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

6. පහත සඳහන් තැනැත්තෝ ආයතනයේ නිලධරයෝ වන්නාහ :—

(අ) අධ්‍යක්ෂවරයා ; සහ

(ආ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡෙදයෙහි කාර්යයන් සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද, එකී තනතුරක් දරන තැනැත්තා.

7. (1) කොමිෂන් සභාව විසින් ප්‍රථම අධ්‍යක්ෂවරයා පත් කරනු ලැබිය යුතු ය. පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයකු ද ආයතනයේ කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තිදෙනකුගෙන් යුතු මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ එසේ පත් කරනු ලැබූ සාමාජිකයා, අධ්‍යක්ෂ තනතුර භාරගැනීම සඳහා ඒ ආයතනය විසින් මුදා හැරිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයෙක් කලින් ධුරය අතහැර ගියහොත් මිස හෝ (4) වන අනුච්ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස් වන විය සම්පූර්ණ වීම යන මේ අවස්ථාවලින් පළමුවෙන් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දරන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයකු දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකාර මණ්ඩලයේ විශේෂ රැස්වීමකදී ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. එවැනි විශේෂ රැස්වීමක මුලසුන දැරීම සඳහා, සාමාජිකයන් විසින්, එම විශේෂ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතුරින් අධ්‍යක්ෂ නොවන යම් සාමාජිකයකු තෝරා පත් කරගත යුතු ය.

(5) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙක්, අධ්‍යක්ෂ වශයෙන් තමා පත් කරනු ලැබීමට ඉහතින් ම, උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු හැටපස් වන විය සම්පූර්ණ කොට නොමැති නම්, උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහුට පෙරළා පැමිණිය හැකි ය.

(6) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධුරයේ කාර්‍ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, එසේ කාර්‍ය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතුය. එසේ වැඩ පිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙද කාර්ය කර ගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇතිවී දින හතක් ඇතුළත (1) වන අනුච්ඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබන තුරු ඒ ධුරයේ කටයුතු කරගෙන යාමට සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතුය. එසේ වැඩ පිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙද කාර්ය කර ගෙන යා යුතු ය.

8. (1) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණ-කාල නිලධරයකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය, නිලධරයා වන්නේ ය. ඔහු කළමනාකාර මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයකු හා සභාපති වන අතර, එක් එක් අධ්‍යයනාංශ කමිටුවක නිල බලයෙන් පත් වූ සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙනයම් බල මණ්ඩලයක හෝ මණ්ඩලයක රැස්වීමකට පැමිණ සිටීමට හා එහිදී කතා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුදු, ඔහු ඒ බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එහි යම් රැස්වීමකදී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(2) කළමනාකාර මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් කලින් කල තමා වෙත නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, ආයතනයට අදාළ වන පරිදි පනතේ හා යම් උචිත සාධන පත්‍රයක යොදා ඇති විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකාර මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම ගැන අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

9. පහත දැක්වෙන බල මණ්ඩල, ආයතනයේ බල මණ්ඩල වන්නේ ය :—

(i) කළමනාකාර මණ්ඩලය ;

(ii) අධ්‍යයන අංශ කමිටුව හෝ කමිටු ; සහ

(iii) නියමාවලි මගින් බල මණ්ඩල වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල.

10. (මෙහි මින් මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලය ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(1) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකවරු, එනම්—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයා ;

(ඇ) සෞඛ්‍යය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයා;

(ඈ) ආයුර්වේද කොමසාරිස්වරයා ;

(ඉ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඊ) ආයුර්වේද මහා ආරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරිවරයා ;

(උ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති ; සහ

(ඌ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශ ප්‍රධානියෝ.

(2) පහත සඳහන් අනෙක් සාමාජිකයන් ; එනම්—

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් සිය සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් තුන් දෙනෙක් ;

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයන් විසින් සිය සාමාජිකයන් අතුරින් පත් කර ගන්නා ලද එක් සාමාජිකයෙක් ; සහ

(ඇ) සංස්කෘතික, අධ්‍යාපනික, වෘත්තීය හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කළ සාමාජිකයන් අට දෙනෙක් ;

එසේ වුව ද, එසේ පත් කරනු ලැබූ සාමාජිකයන් අතුරින් යටත්පිරිසෙයින් පස් දෙනකු දේශීය වෛද්‍ය වෘත්තියට අයත් සාමාජිකයන් විය යුතු ය.

11. (1) අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සභාපති විය යුතු අතර, ඔහු එහි සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මූලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත්, සාමාජිකයින් විසින්, පැමිණ සිටින යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරීමට තෝරා පත් කර ගත යුතු ය.

(2) තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයෙක්, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, අවස්ථා වෝචිත පරිදි, ඔහු පත් කර ගනු ලැබූ දින සිට හෝ තෝරා පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන තුන් වර්ෂයක කාලයක් ධුරය දරන අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත තෝරා පත් කරගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුව ද, යම් තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත්වීමට පෙර තම ධුරය අත්හැර ගියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

එසේම තවදුරටත්, තෝරා පත් කර ගන්නා ලද එක් එක් සාමාජිකයා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සෙක් වූයේ යම් තත්ත්වයක් නැතහොත් සාමාජිකත්වයක් අනුව ද, ඒ තත්ත්වය හෝ සාමාජිකත්වය දරන තාක් පමණක් ඔහු තම ධුරය දරන්නේ ය.

(3) මණ්ඩලයට තෝරා පත් කරගනු ලැබූ යම් සාමාජිකයකුට, තම අත්සන යටතේ වූ අධ්‍යක්ෂ වෙත යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයට පත් කරනු ලැබූ සාමාජිකයකුට, තම අත්සන යටතේ වූ කොමිෂන් සභාවේ සභාපතිවරයාට යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) යම් පත් කරනු ලැබූ සාමාජිකයකු කලින් අවසර ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වුවහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හැර ගියා සේ සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීමට කොමිෂන් සභාව විසින් සුදුසු තැනැත්තෙකු පත් කළ යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයකුට යම් පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත්, නිල බලයෙන් පත් වන සාමාජිකයකු නොවන සාමාජිකයකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා ගෙවනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) එක් එක් වර්ෂයකදී අටකට නොඅඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, මණ්ඩලය රැස්විය යුතු ය.

(9) අවශ්‍ය යයි තමා සලකන කවර අවස්ථාවක නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නො අඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබී සතියක් ඇතුළත අධ්‍යක්ෂ විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

12. (1) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනය වෙත මෙම නියමාවලියෙන් පැවරෙන නැතහොත් නියම කෙරෙන බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය මණ්ඩලය සතු වන්නේ ය.

(3) (1) වන සහ (2) වන අනුච්ඡේදවලින් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් සතුව සිටීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ආ) ආයතනයට සම්බන්ධ සියලු කාරණා පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(ඇ) නිශ්චිත කාර්යයන් සඳහා ආයතනයට සුදුස්සක් කර ගැනීමට සපයන ලද යම් අරමුදල් පරිපාලනය කිරීම ;

(ඈ) ආයතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා වෙනත් ප්‍රදාන මගින් පවරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම ;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගණන් සලකා බැලීම සහ ඒ වාර්තා සහ ගණන් විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(උ) දේශීය වෛද්‍ය විද්‍යාවේ විවිධ අංශයන්හි ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලැබිය යුතු පුහුණුව, සාමර්ථ්‍යය ලැබිය යුතු විභාග පිළිබඳවත්, එවැනි උපාධි, අභිඥන පත්‍ර, සහතික පත්‍ර සහ ශාස්ත්‍රීය විශිෂ්ටතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරා ලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත් අදළ අධ්‍යයන අංශ කමිටුව හෝ කමිටු විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පැනවීම සඳහා ඉදිරිපත් කිරීම ;

එසේ වුව ද, අදල අධ්‍යයන අංශ කමිටුවේ හෝ කමිටුවල වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මිස, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් කිසිම අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් නොකළ යුතු ය.

(එ) අදළ අධ්‍යයන අංශ කමිටුවේ හෝ කමිටුවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට අදළ නියෝග කෙටුම්පත් කර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ඒ) රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ හෝ රීති සෑදිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සඳහා රීති කෙටුම්පත් කිරීම සහ ඒ කෙටුම්පත් අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ පාලක සභාවට හෝ සනාතන සභාවට පැනවීම සඳහා ඉදිරිපත් කිරීම ;

(ඔ) ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, ලී බඩු, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඕ) (i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි මහාචාර්යධුර, සහාය මහාචාර්යධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යධුර, කථිකාචාර්යධුර හා වෙනත් යම් තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටවීම සම්බන්ධයෙන් ; සහ

(ii) ආයතනයේ සේවයට පත් කරනු ලබන ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ සහ වෙනත් සේවකයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන්

විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ක) ආයතනයෙහි සේවයේ යෙදී සිටින තැනැත්තන්ගේ සේවය තාවකාලිකව අත්හිටවීම, ඔවුන් සේවයෙන් පහකිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ට දඬුවම් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ;

(ග) ආයතනයේ ආචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් ලෙස පිළිගැනීම සුදුසු සේ සලකනු ලබන තැනැත්තන් විශ්ව විද්‍යාලයේ පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ච) අදළ අධ්‍යයන අංශ කමිටුවේ හෝ කමිටුවල වාර්තා සලකා බැලීමෙන් පසු සහ විශ්වවිද්‍යාලයේ අනුමතය සහිතව—

(i) පවත්නා අධ්‍යයන අංශ ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් අධ්‍යයන අංශ සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ii) දේශීය වෛද්‍ය විද්‍යාවේ අංශයන් අදළ අධ්‍යයන අංශවලට පැවරීම පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ජ) මණ්ඩලයට සුදුසු යයි පෙනී යන ප්‍රමාණයක ස්ථාවර කමිටු හෝ තත් කාර්ය කමිටු පත් කිරීම, ඒවායේ විෂය කරුණු නියම කිරීම සහ ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම ;

(ට) අදළ අධ්‍යයන අංශ කමිටුව හෝ කමිටු විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයේ සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ;

(ඩ) ආයතනයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය ශුභසිද්ධිය වර්ධනය කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයන් ද ඇතුළත් විය යුතු ශුභසාධක මණ්ඩලයක් පත් කිරීම සහ එකී මණ්ඩලයේ සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍යයන් නිශ්චය කිරීම ;

(ණ) ප්‍රයෝජනයට නොයොදු ඇති යම් ආදායමක්ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නීත්‍යානුකූලව ආයෝජන කළ හැකි යම් සුරකුම් පතක ආයෝජනය කිරීම ; නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිළට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම ;

(ත) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ නියමාවලියෙහි හෝ යම් වෙනත් උචිත සාධන පත්‍රයක හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වා නොමැති වූ, ආයතනයේ අනෙකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම ;

එසේ වුව ද, උචිත අධ්‍යයන අංශ කමිටුවේ මතය මණ්ඩලය වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් එම කමිටුවට දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතු ය. එසේම තවදුරටත්, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, එසේ සම්මත කර ගන්නා ලද යෝජනාවක් ක්‍රියාත්මක නොකළ යුතු ය :—

මේ ඡෙදයෙහි "අධ්‍යයන කාරණය" යන්නෙන් උචිත අධ්‍යයන අංශ කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් කාරණයක් අදහස් වේ.

13. ආයතනය විසින් දේශීය වෛද්‍ය විද්‍යාවේ පහත සඳහන් එක් එක් අංශයන් සම්බන්ධයෙන් ද, කළමනාකාර මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දේශීය වෛද්‍ය විද්‍යාවේ අනෙකුත් එක් එක් අංශයන් සම්බන්ධයෙන් ද එක් අධ්‍යයන අංශයක් බැගින් ප්‍රතිෂ්ඨාපිත කළ යුතු ය.

(1) ආයුර්වේද ;

(2) සිද්ධ ; සහ

(3) යුනානි.

14. (1) ආයතනයේ පූර්ණ-කාල නිලධරයකු හා අධ්‍යයන අංශයේ පරිපාලන හා ශාස්ත්‍රීය ප්‍රධානයා විය යුතු අංශ ප්‍රධානයකු එක් එක් අධ්‍යයන අංශයකට සිටිය යුතු ය. ඔහු අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත ඒ අධ්‍යයන අංශයේ ආචාර්යවරයන් අතුරින් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ධුරය දරන අතර, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(3) කලින් අවසර ලබා නොපැමිණීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට යම් අධ්‍යයන අංශයක ප්‍රධානියාට තාවකාලිකව නොහැකි වූ අවස්ථාවක, ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට අධ්‍යක්ෂවරයා විසින් අදාළ අධ්‍යයන අංශයේ වෙනත් ආචාර්යවරයකු පත් කළ යුතු ය. එසේ වුව ද, අධ්‍යයන අංශයක ප්‍රධානයකු විශ්‍රාම ගන්නා අවස්ථාවක හෝ ඉල්ලා අස්වන අවස්ථාවක හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ අවස්ථාවක අධ්‍යයන අංශයේ ප්‍රධානයාගේ ධුරය පුරප්පාඩු වූ ලෙස සැළකිය යුතු අතර (1) වන අනුච්ඡෙදය අනුව නව අංශ ප්‍රධානයකු පත් කළ යුතු ය. එසේ පත් කරනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

15. (1) එක් එක් අධ්‍යයන අංශයට අධ්‍යයන අංශ කමිටුවක් තිබිය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන්, සමන්විත විය යුතු ය :—

(අ) අධ්‍යයන අංශ ප්‍රධානයා, ඔහු සභාපති විය යුතු ය ;

(ආ) අධ්‍යක්ෂවරයා ;

(ඇ) ස්වකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින්නා වූ සහ ආයතනයේ ඉගැන්වීමේ කාර්යයන්හි යෙදී සිටින්නා වූ අධ්‍යයන අංශයේ ආචාර්යවරයන් සහ වෙනත් කාර්ය මණ්ඩලය ; සහ

(ඈ) ආයතනයේ සාමාජිකයන් නොවන්නා වූ ද, අධ්‍යයන අංශයට අදාළ දේශීය වෛද්‍ය විද්‍යා අංශයේ විශිෂ්ඨත්වයක් දරන්නා වූ ද, පුද්ගලයන් අතුරින් මණ්ඩලය විසින් පත් කරන ලද තැනැත්තන් තිදෙනෙක්.

(2) නිශ්චිත කාර්යයක් සඳහා නිශ්චිත කාල පරිච්ඡෙදයකට එක් අයකු හෝ එක් අයකුට වැඩි සංඛ්‍යාවක් මණ්ඩලයේ එකඟත්වය ඇතිව අධ්‍යයන අංශ කමිටුවකට සහායවීමට සම්බන්ධ කර ගත හැකි ය. එසේ සම්බන්ධ කර ගත් කිසිම තැනැත්තකුට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත්වීමට හෝ එම කමිටුවේ රැස්වීමකදී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(3) යම් අධ්‍යයන අංශ කමිටුවකට පත් කරන ලද එක් එක් සාමාජිකයකු සම්බන්ධයෙන් 11 ඡෙදයේ (2) වන (4) වන සහ (5) වන අනුච්ඡෙදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(4) (1) වන අනුච්ඡෙදයේ (ඇ) වගන්තිය යටතේ සාමාජිකයන් වන සාමාජිකයන් අතුරින්, එම කමිටුව විසින් තෝරා පත් කළ යුතු ලේකම්වරයකු එක් එක් අධ්‍යයන අංශ කමිටුවක් සඳහා සිටිය යුතු ය.

(5) අධ්‍යයන අංශ කමිටුවක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු අතර, සහායවීමට සම්බන්ධ කරගත් සාමාජිකයන් ඇත්නම්, ඔවුන් මේ කාර්යය සඳහා බැහැර කළ යුතු ය.

(6) එක් එක් වර්ෂයකදී දහයකට නොඅඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, එක් එක් අධ්‍යයන අංශ කමිටුව රැස්විය යුතු ය.

16. (1) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, එක් එක් අධ්‍යයන අංශ කමිටුවකට, දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාළ අංශයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සතු වන්නේ ය.

(2) (1) වන අනුච්ඡෙදයෙන් එක් එක් අධ්‍යයන අංශ කමිටුවක් වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එක් එක් අධ්‍යයන අංශ කමිටුවක් විසින් දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාළ අංශයට සම්බන්ධ පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(අ) මණ්ඩලය විසින් තමන් වෙත යොමු කරන ලද කවර කරුණක් හෝ පිළිබඳව සලකා බැලීමෙන් පසු වාර්තා කිරීම ;

(ආ) දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාළ අංශයේ අධ්‍යයන පාඨමාලා ඉගැන්වීමේ වැඩ සටහන හෝ සටහන් හා විභාග ආදිය සම්බන්ධිත වූ සියලු කාරණා ගැන නිර්දේශ හා වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා, අධ්‍යයන අංශ කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුල් කරවා ගැනීම සඳහා තිබිය යුතු අවශ්‍යතා මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඉ) දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාළ අංශයෙහි අධ්‍යයන පාඨමාලා හා විභාග සම්බන්ධ නියෝග කෙටුම්පත් කිරීම සහ එකී කෙටුම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඊ) ආචාර්යවරයන් සහ විභාග පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා සලකා බැලීමට සුදුසු තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(උ) දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාළ අංශයට නියමිත විභාග සමත්වීමෙන් හා වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් එම අංශයට අදාළ උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති පුද්ගලයන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඌ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා තරඟ කිරීමේ ක්‍රමය හා කොන්දේසි මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා සුදුසු පුද්ගලයන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ; සහ

(ඒ) (i) පවත්නා අධ්‍යයන අංශ ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් අධ්‍යයන අංශ සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ii) දේශීය වෛද්‍ය විද්‍යාවේ අංශයන් අදාළ අධ්‍යයන අංශවලට පැවරීම

පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

17. ආයතනයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේ ය.

18. (1) (මෙහි මින් මතු ''අරමුදල'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය වෛද්‍ය විද්‍යා ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ආයතනයට තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය :—

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන කරන ලදුව, කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල් ; සහ

(ඈ) ආයතනයට අයිති වූ ද, කවර ප්‍රභවයකින් හෝ අත්කර ගනු ලැබුවා වූ ද, වෙනත් සියලු මුදල්.

(2) යම්කිසි මාසයක් තුළදී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක් උචිත වූ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟ ඉදිරි මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂ විසින් කොමිෂන් සභාවට දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

19. (අ) නියමාවලි මගින් පනවනු ලැබිය හැකි පිළිවෙළට හා ආකාරයට ආයතනයේ ගණන් තැබීම ;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ ඒ මුදල් නිසි ගණන් ශීර්ෂයන්ට බැර කිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඈ) කොමිෂන් සභාවට අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන මණ්ඩලය සඳහා පිළියෙල කිරීම

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

එසේ වුව ද, ආයතනයේ ගිණුම්වල නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාග වලින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙළින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමින් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

20. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට සිය ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගණන් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කළ යුතු ය.

(2) ආයතනයේ ගණන් පොත් ආයතනයේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

21. උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනය සම්බන්ධයෙන් පනතේ XIII වන කොටසේ යම් විධිවිධානයක් අදාළ ද එම විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ ගණන් විගණනයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

22. (1) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ආයතනය විසින් විශ්වවිද්‍යාලයේ එකඟත්වය සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව සලකනු ලබන නිලධරයන්, ආචාර්යවරයන් සහ වෙනත් සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට අයත් විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්‍ය මණ්ඩලයෙන් මුදා හැරීමෙන් ලබාදීම හෝ කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය විසින් පත් කිරීමෙන් හෝ කළ යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් කෙරෙහි හා පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවිය යුතු ය. අනෙකුත් අවස්ථාවක විශ්වවිද්‍යාලය විමසීමෙන් පසු කොමිෂන් සභාවේ අනුමතය සහිතව ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අදාළ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයාට ගෙවිය හැකි ය.

(4) අධ්‍යක්ෂගේ විධානවලට හා විනය පාලනයට ආයතනයේ කාර්ය මණ්ඩලය යටත් විය යුතු ය.

23. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කරගනු ලැබී ද, පත් කරනු ලැබී ද, නම් කරනු ලැබී ද, අතිරේකව යොදනු ලැබී ද නැතහොත් ඔහු ඒ බල මණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයේ සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් ප්‍රශ්නයක් පැන නැගුනහොත්, ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

24. ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ යම් දෝෂයක් හෝ දෝෂ ඇතිවීමේ හේතුවෙන් පමණක් අවලංගු නොවන්නේ ය.

25. මෙම නියමාවලියෙහි—

"ආචාර්යවරයා" යන්නෙන් මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, කථිකාචාර්යවරයෙක්, සහකාර කථිකාචාර්යවරයෙක් හෝ යම් තනතුරක් දරන තැනැත්තෙක් ආචාර්යවරයකු වශයෙන් නියමාවලිය මගින් ප්‍රකාශ කරනු ලැබ ඇද්ද ඒ තැනැත්තා ද අදහස් වේ ;

"උචිත සාධන පත්‍රය" යන්නෙන් පනතේ විධිවිධාන අනුව කරනු ලැබූ යම් නියමයක්, සාදනු ලැබූ නියමාවලියක්, ලිඛිත ව්‍යවස්ථාවක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන් පනතේ විධිවිධාන අනුව ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ;

"දේශීය වෛද්‍ය විද්‍යාවේ අංශය" යන්නෙන් ආයුර්වේද, සිද්ධ, යුනානි හෝ ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද්ද වූ වෙනත් යම් අංශයක් ද අදහස් වේ ; සහ

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී